# ලංසු කැඳවීම

## ශ්‍රී ලංකාවේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර සඳහා ICAO-PKD ඒකාබද්ධ කිරීම ඇතුළත්ව ජාතික විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර පොදු යතුරු යටිතල පහසුකම් (PKI) විසඳුම සහ විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය කිරීමේ සේවා ප්‍රසම්පාදනය කිරීම

**IFB අංකය: DIE/PRO/PKI/2026**

**1.** ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු (HLPC) සභාපතිවරයා විසින්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන්, ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ **විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර සඳහා ICAO-PKD ඒකාබද්ධ කිරීම ඇතුළත්ව ජාතික විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර පොදු යතුරු යටිතල පහසුකම් (PKI) විසඳුම සහ විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය කිරීමේ සේවා ප්‍රසම්පාදනය** සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

**2.** මෙම ප්‍රසම්පාදනය ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2024හි නිශ්චිතව දක්වා ඇති **ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ (ICB – තනි අදියර, ද්විත්ව කවර ලංසු ක්‍රමවේදය)** ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර, එම මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි සියලුම සුදුසුකම්ලත් ලංසුකරුවන්ට මේ සඳහා සහභාගි විය හැකිය. ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වන විට ලංසුකරු අසාධු ලේඛනගත කර හෝ තහනමකට ලක් කර හෝ නොතිබිය යුතුය.

**3.** සුදුසුකම්ලත් ලංසුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායකවලට පහත සඳහන් කරුණු ඇතුළත් වේ. (අතිරේක සුදුසුකම් සඳහා අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනයේ දක්වා ඇත.)

**අ) සාමාන්‍ය පළපුරුද්ද**

ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයට පෙර, විද්‍යුත් ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණ විසඳුම් ක්‍රියාත්මක කිරීම හා තාක්ෂණික මෙහෙයුම් සම්බන්ධයෙන් සහ ICAO-PKD ඒකාබද්ධ කිරීම සහිත ජාතික විද්‍යුත් ගමන් බලපත්‍ර පොදු යතුරු යටිතල පහසුකම් (PKI) විසඳුමක් සැලසුම් කිරීම, සැපයීම, ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම, භාවිතය සඳහා සක්‍රිය කිරීම, මෙහෙයුම් ආරම්භ කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් ලංසුකරු සතු විය යුතුය.

**ආ) සමාන ස්වභාවයේ කොන්ත්‍රාත් සම්බන්ධ නිශ්චිත පළපුරුද්ද**

**i.** ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයට පූර්වයෙන් වූ පසුගිය වසර හත (07) තුළදී ලංසුකරු විසින් විද්‍යුත් ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණ පහසුකමක් සාර්ථකව ක්‍රියාත්මක කර තිබිය යුතුය, නැතහොත් වර්තමානයේ විද්‍යුත් ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණ පහසුකමක් මෙහෙයවමින් සිටිය යුතුය. මෙම අවස්ථා දෙකෙන් ඕනෑම අවස්ථාවක, ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස, එක් කොන්ත්‍රාත්තුවක් යටතේ අවම වශයෙන් විද්‍යුත් ගමන් බලපත්‍ර (e-Passports) මිලියන තුනක් (3,000,000) ක් පුද්ගලාරෝපණය කිරීමේ කටයුතු සම්පූර්ණ කර තිබිය යුතුය. මෙම කොන්ත්‍රාත්තුවේ විෂය පථයට පුද්ගලාරෝපණ ක්‍රියාවලිය ආරම්භයේ සිට අවසානය දක්වා වූ වගකීම ඇතුළත් විය යුතු අතර, එයට දෘඩාංග උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම, මෘදුකාංග සංරචක සැලසුම් කිරීම, සැපයීම සහ ක්‍රියාත්මක කිරීම, තාක්ෂණික මෙහෙයුම් සහ නඩත්තු කටයුතු ද ඇතුළත් වේ.

**ii.** ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයට පූර්වයෙන් වූ පසුගිය වසර දහය (10) ඇතුළත, ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස ICAO-PKD ඒකාබද්ධ කිරීම ඇතුළත්ව ජාතික විද්‍යුත් ගමන් බලපත්‍ර සඳහා

පොදු යතුරු යටිතල පහසුකම් (PKI) විසඳුමක් අවම වශයෙන් එක් (01) අවස්ථාවකදී හෝ සාර්ථකව සපයා නඩත්තු කර තිබිය යුතුය. ඉදිරිපත් කරනු ලබන එම ස්ථාපනය/ක්‍රියාත්මක කිරීම වර්තමානයේදීත් මෙහෙයුම් තත්ත්වයේ පැවතිය යුතුය.

**ඇ) තත්ත්ව සහ ආරක්ෂක අවශ්‍යතා**

ලංසුකරු **ISO 9001:2015** සහ **ISO 27001** සහතිකකරණය ලබා ඇති ආයතනයක් විය යුතුය.

**ඇ) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම**

2023 ජනවාරි 1 දින සිට 2026 මාර්තු 31 දින දක්වා වූ මූල්‍ය වර්ෂ තුනක් (03) සඳහා ඉදිරිපත් කරන ලද විගණනය කරන ලද මූල්‍ය වාර්තා මගින් සනාථ කළ හැකි පරිදි, ලංසුකරුගේ අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම ඇමරිකානු ඩොලර් මිලියන දහයක් (USD 10,000,000) හෝ ඊට සමාන වටිනාකමක් විය යුතුය.

**ඉ) මූල්‍ය සම්පත්**

මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රවාහ අවශ්‍යතාව සපුරාලීම සඳහා, ලංසුකරු සතුව තම අනෙකුත් බැඳීම්වලින් පසු ඇමරිකානු ඩොලර් මිලියන 1.8කට (USD 1,800,000) නොඅඩු ද්‍රවශීල වත්කම්, ණය පහසුකම් හෝ වෙනත් මූල්‍ය ක්‍රම ආදි මූල්‍ය සම්පත් පවතින බව හෝ ඒ සඳහා ප්‍රවේශය ඇති බව සනාථ කළ යුතුය.

4. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන් සඳහා වැඩිදුර තොරතුරු **නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 5 වන මහල, ''සුහුරුපාය'', ශ්‍රී සුභූතිපුර මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව** වෙතින් හෝ දුරකථන අංක **+94112101559**, විද්‍යුත් තැපැල **dcprocu@immigration.gov.lk** ඔස්සේ ලබාගත හැකිය. ප්‍රසම්පාදන ලේඛනය **2026 සැප්තැම්බර් 18** දින සිට වැඩකරන දිනවල පෙ.ව. **9.00 සිට ප.ව. 3.00** දක්වා නොමිලේ පරීක්ෂා කළ හැකිය. මෙම ප්‍රසම්පාදන ලේඛනය තොරතුරු දැන ගැනීමේ අරමුණ සඳහා පමණක් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවියේ (www.pubsec.gov.lk) සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.immigration.gov.lk) පළ කර ඇත.

5. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ව්‍යාපාරික ලිපි ශීර්ෂයක් මත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් සහ ආපසු නොගෙවනු ලබන රුපියල් 250,000.00 ක මුදලක් මුදලින් ගෙවීම මගින් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙළ කරන ලද සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තු කාර්යාලයෙන් (ඉහත 3 වන ඡේදයේ දක්වා ඇති ලිපිනය) මිලදී ගත හැකිය.

**6.** ලංසු 2026 නොවැම්බර් 02 දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ඉහත 3 වන ඡේදයේ සඳහන් ලිපිනය වෙත භාර දිය යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, එනම් 2026 නොවැම්බර් 02 දින ප.ව. 3.00ට, සහභාගී වීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ. සියලුම ලංසු සමඟ, ශ්‍රී ලංකා රුපියල් මිලියන තිස්පහ (රු. 35,000,000) කට නොඅඩු වටිනාකමකින් යුත්, හෝ ශ්‍රී ලංකාව තුළ නිදහසේ පරිවර්තනය කළ හැකි මුදල් ඒකකයකින් ඊට සමාන වටිනාකමකින් යුත්, බැංකු ඇපකරයක (Bid Security) ආකාරයෙන් වූ ලංසු සුරැකුමක් ඉදිරිපත් කළ යුතුය.

**7.** 2026 ඔක්තෝබර් 02 වන දින පෙරවරු 10.30 ට, ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය", 7 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේ දී පූර්ව ලංසු රැස්වීමක් (Pre-Bid Meeting) පැවැත්වේ. උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන්ට මෙම පූර්ව ලංසු රැස්වීම සඳහා සහභාගී විය හැකිය.

සභාපති
ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව (HLPC)
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**
5 වන මහල, ''සුහුරුපාය'',
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.
ශ්‍රී ලංකාව.
2026 සැප්තැම්බර් 18